000004

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් II "අ" පන්තියේ සිට I පන්තියට

උසස් කිරීමේ විභාගය - 2014

ලිතෝ මුද්‍රණ ශිල්පය I

(ලිතෝ මුද්‍රණ ශිල්පීන් සඳහා)

2014.09.27 කාලය පැය තුන (03) යි 1300-1600 පැය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

1. (i) ලිතෝ තීන්තවල වාහකය මගින් ඉටු කෙරෙන කාර්යයන් 02 ක් දක්වන්න.

(ii) මුද්‍රණ තීන්ත;

(අ) සෙට් වන්නේ (Set)

(ආ) වේලෙන්නේ (Dry)

කෙසේද?

(iii) මුද්‍රණ තීන්ත වේලීමට බලපාන බාහිර සාධක 02 දක්වන්න.

(iv) ස්පොට් වාර්නිෂින් (Spot Varnishing) යනු කුමක් ද?

(v) එකම රූපය කෝටඩ් (Coated) සහ (Uncoated) කඩදාසි දෙවර්ගයක වෙන වෙනම මුද්‍රණය කලහොත් ඔබ දකින වෙනස කුමක්ද?

(vi) ඉහත සඳහන් වෙනස ඇතිවීමට හේතු 02 ක් දක්වන්න.

(vii) අතින් සාදන කඩදාසි වල ග්‍රේන් දිශාවන් (Grain Direction) නොමැති වීමට හේතුව කුමක්ද?

(viii) මුද්‍රණ කඩදාසි ගොඩක්, තෙත් පරිසරයකට නිරාවරණය වන පරිදි තිබුනහොත් මුද්‍රණයේ දී කුමන අපහසුතා සිදුවිය හැකිද?

2. (i) නිවුස් කඩදාසි

(ii) පෝස්ටර් කඩදාසි

(iii) ආර්ට් කඩදාසි

(iv) බොක්ස් බෝඩ්

ඉහත එක් එක් කඩදාසි/බෝඩ් වර්ගයක ප්‍රායෝගික භාවිතය සලකා බැලීමේදී එක් එක් නිෂ්පාදනයේ දී සිදුකරන වෙනස්කම් පැහැදිලි කරන්න.

3. ඔබගේ ආයතනය වෙත එන පාරිභෝගිකයෙක්, ප්‍රොසෙස් වර්ණ සහ විශේෂ වර්ණයක් ද සහිත වෙළඳ දැන්වීමක් ආර්ට් කඩදාසියේ ඉහළ මුද්‍රණ තත්ත්වයෙන් මුද්‍රණය කරදෙන ලෙස ඉල්ලා සිටී. ඔබගේ යන්ත්‍රයේ මෙය මුද්‍රණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

4. "ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක ආයුකාලය යන්ත්‍ර ක්‍රියාකරුවා අත පවතී" මෙම කියමනට පක්ෂව කරුණු දක්වන්න.

5. සාමාන්‍ය තීන්ත පද්ධතියක තීන්ත සැපයුම් යන කොටස <u>ප්‍රමුඛක්</u> ඇඳ එහි අනුකොටස නම් කරන්න. මෙම තීන්ත සැපයුම සහ දුරස්ථ පාලන ක්‍රමයට (Remote Controlled) තීන්ත සෙට් කරන මුද්‍රණ යන්ත්‍රයක තීන්ත සැපයුම අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් II "අ" පන්තියේ සිට I පන්තියට

උසස් කිරීමේ විභාගය - 2014

ලිතෝ මුද්‍රණ ශිල්පය II

(ලිතෝ මුද්‍රණ ශිල්පීන් සඳහා)

2014.09.28 කාලය පැය තුන (03) යි 0900-1200 පැය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

1. (i) අද ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මුද්‍රණ ක්‍රම 05 ක්ද, ඩිජිටල් මුද්‍රණ ක්‍රම 03 ක්ද බහුල වශයෙන් භාවිත කෙරේ. මේවා නම් කරන්න.

   (ii) ඕනෑම මුද්‍රණ ක්‍රියාවලියක් බෙදිය හැකි ප්‍රධාන කොටස් 03 මොනවාද?

   (iii) ලිතෝ ප්ලේට් නිෂ්පාදනයේ දී,

   (අ) ග්‍රේන් කරන්නේ (Grain)

   (ආ) ඇනෝඩයිස් කරන්නේ (Anodise)

   (ඇ) ආලෝකයට සංවේදී ද්‍රව්‍යයක් ගල්වන්නේ

   කුමක් සඳහා ද?

   (iv) ලිතෝ ප්ලේට් එකක් ගම් කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?

2. (i) ෆවුන්ටන් සොලියුෂන් (Fountain Solution) වලට පොස්ෆරික් අම්ලය දැමීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

   (ii) ෆවුන්ටන් සොලියුෂන්වල ආම්ලිකතාව වැඩි වූ විට තීන්ත වේලීම ප්‍රමාද වන්නේ ඇයි?

   (iii) ඇල්කොහොල් ඩැම්පින් පද්ධති වල ෆවුන්ටන් සොලියුෂන් සැපයීම සඳහා යන්ත්‍රයට ඈතින් වෙනම ටැංකියක් භාවිතා කරන්නේ ඇයි?

   (iv) කවර රහිත ඩැම්පර් භාවිතා කිරීමේ වාසි අවාසි මොනවාද?

3. (i) තීන්ත රෝලක් භාවිතයේ දී එහි දැඩි බව (Hardness) මැන බැලීම වැදගත් වන්නේ ඇයි?

   (ii) ලිතෝ මුද්‍රණ යන්ත්‍රයක රෝල් සේදීමේදී සේදීමෙන් පසු රෝල් මත තීන්ත ඉතිරිව ඇත්නම් ඊට හේතුවිය හැකි කරුණු 03 ක් දක්වන්න.

   (iii) ඔෆ්සෙට් බ්ලැන්කට් එකක් භාවිතා කිරීමේ වාසි 03 දක්වන්න.

   (iv) හොඳ බ්ලැන්කට් එකක තිබිය යුතු ගුණාංග 03 දක්වන්න.

   (v) බ්ලැන්කට් ආරක්ෂා සහිතව ගබඩා කිරීම සඳහා භාවිතා කළ යුත්තේ කෙබඳු ස්ථානයක්ද?

4. (i) මුද්‍රණ පීඩන වැඩි වූ විට සිදුවිය හැකි හානි මොනවා ද?

   (ii) ලිතෝ ප්ලේට් සඳහා ප්ලාස්ටික් පැකිං යෙදීමේ වාසි 02 ක් දක්වන්න.

   (iii) මුද්‍රණ තත්ව පාලනය යනු කුමක්ද යන්න සහ එය කල යුත්තේ කෙසේද යන්න ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරුවෙකුට වැදගත් වන්නේ කෙසේ දැයි යන්න පැහැදිලි කරන්න.

   (iv) අවශ්‍ය මුද්‍රණ තත්ත්වය පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය අනුව වෙනස් වන ආකාරය පෙන්වීමට උදාහරණ 02 ක් දක්වන්න.

5. ඔබගේ මුද්‍රණ යන්ත්‍රයේ තීන්ත පද්ධතියේ සෙට් කල හැකි සියලුම රෝල් නිවැරදිව සෙට් කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.